
# උදෑසී

## තියුණු සන්නිවේදනයක රටාව



**සමාජවාදී තරුණ සංගමය- මහනුවර/සෙංකඩගල**



# "කලාකරුවා ජනතාවගේ රිද්මය හඳුනාගත යුතුයි."

- නාට්‍යවේදී සහ මාධ්‍යවේදී මොරිස් රත්නායක

වසර ගණනාවක් මහනුවර ප්‍රදේශයේ කලාකරුවකු ලෙසත් මාධ්‍යවේදියකු ලෙසත් සමාජ ක්‍රියකාරිකයකු ලෙසත් සේවය කරමින් ජනතාවගේ ආදරය දිනා ඇති මොරිස් රත්නායක මහතා සමඟ කල සාකච්ඡාව.

**1.ඔබතුමා කලාවට සහ මාධ්‍ය ක්ෂේත්‍රයට පිවිසි අන්දම පිළිබඳ මතකය අවදි කරන්න පුළුවන්ද?**

ශාන්ත සිල්වෙස්ටර් විද්‍යාලයේ තුන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන අවධියේ දහම් පාසල් නාට්‍යයක දේවදූතයකුගේ චරිතයකට පණපොවමින් තමයි නාට්‍ය රංගනය අරඹන්නේ. ඉන්පසු පාසල් නාට්‍ය කණ්ඩායම දිගටම නියෝජනය කළා. පසුවත් පාස්කු හා නත්තල් නාට්‍ය වලට සහභාගී වුනා. පාසල් අවධියේම මිහිර පත්තරයට කවි ලිව්වා. මතක විදිහට අම්මා මාතෘකාවට තිත් පේලි කීපයකට පසු හොඳයි කියා ලිවීම තමයි පලවුනු මුල්ම කවිය. පාසලින් සමුගත් පසු ඇත්ත පත්තරයට,කිනිහිර පත්තරයට සැබෑ සහ අන්වර්ත නම් වලින් ලිපි ලිව්වා. වෘත්තීය නාට්‍ය ජීවිතය අරඹමින් රාජා උස්වැටකෙයියාව මහතාගේ 'කිරට හඬන දරුවෝ' නාට්‍යයට සහ රංජිත් කේ. රාජපක්ෂ මහතාගේ 'රාජ ජල්ලිය' නාට්‍යයට රංගනයෙන් දායක වුනා. 'කොටි වලිගය' සිනමා පටයට අතිරේක රංගනයෙන් දායක වුනා. 'පුදසුන' ඒකාංගික ටෙලිනාට්‍යය පුංචි තිරයේ පළමු අත්දැකීමයි.

**2. ලැබූ ජයග්‍රහණ මොනවාද?**

මාධ්‍යය ක්ෂේත්‍රයේදී මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියාවක් වාර්තා කර අභීත වාර්තාකරණයට සම්මානයක් ලැබුවා. 2011 පළාත් නාට්‍ය උලෙළේදී මගේ නිර්මාණයක් වූ 'පොලිඑස්ටර්' නාට්‍යයට හොඳම නාට්‍යට හිමි සම්මානය ඇතුළු සම්මාන හතරක් හිමිවුණා. හොංකොං රාජ්‍යයේදී ආසියානු රටවල් හතක කිතුණු සංගමයකින් පැවති නාට්‍යයකට සම්බන්ද වී සහය වේශනිරූපණයට සම්මාන ලැබුවා.

**3.ඔබේ ප්‍රියතම කළා මාධ්‍යය කුමක්ද?**

මා වැඩියෙන් ප්‍රිය කරන්නනේ සජීවී ඉදිරිපත් කිරීම් නිසා වේදිකා නාට්‍යට සහ වීදි නාට්‍යට වැඩිපුර කැමතියි. එය අපට ප්‍රේක්ෂකයා ඉදිරියේ සෘජුව පෙනී සිටීමට අවස්ථාව සළසනවා.

## 4. විකල්ප ධාරාවේ කලාව යනු කුමක්ද?



සමාජය මිරිකෙන ප්‍රශ්න පිළිබඳව ජනතාව සමඟ සෘජුව සාකච්ඡා කරන කලා මාධ්‍ය විකල්ප කලාව ලෙස දකිනවා. එයට මා දකින අන්දමින් හොඳම ස්ථානය පදික වේදිකාවයි. මිනිසුන්ගේ ප්‍රශ්න මිනිසුන් හඳුනා නොගෙන එයින් ගොඩ ඒමට උත්සහ නොකිරීමේ ගැටළුව ප්‍රහසනාත්මක නිර්මාණයක යටිපෙලින් ගෙන ඒමට උත්සහ කිරීමට මා කැමතියි. එවිට ප්‍රේක්ෂකයා සිනාසෙමින් නාට්‍යය නැරඹුවද පසුව ඒ පිළිබඳව සිතා බැලීමට යොමුවනවා. විකල්ප ධාරාවේ කලාකරුවන් ලෙස අප කළ යුත්තේ එයයි.

## 5. කලාකරුවෙකුගේ සමාජීය වගකීම කෙබඳුද?

කලාකරුවෙකු ජනතාවගේ රිද්මය හඳුනාගැනීමට සමත්විය යුතුය. එමෙන්ම ඉහත කියූ පරිදි ජනතාව පෙලෙන ගැටළු පිළිබඳව සමාජය දැනුවත් කල යුතුය. මා දකින අන්දමට ජනතාවගේ තරාතිරම කුමක් වුවත් මේ සමාජ ආර්ථික ක්‍රමවේදය හේතුවෙන් බොහෝදෙනා පීඩාවට පත්වී ඇති නිසා කලාකරුවෙකුගේ වගකීම විය යුත්තේ එය වෙනස් කිරීමේ ගමනට එක් පියවරකින් හෝ දායක වීමයි.

## 6. විකල්ප ධාරාවේ තරුණ කලාකරුවන්ට ඔබ ලබාදෙන පණිවිඩය කුමක්ද?

පළමුව ඔවුන් සමාජය නිවැරදිව හඳුනාගත යුතුය. එය විශ්ලේෂණාත්මකව දැකිය යුතුය. අංකුර කලාකරුවෙක්, මාධවේදියෙක් හෝ සමාජ ක්‍රියාකරුවෙක් වීමට පෙර සමාජයේ බිම් මට්ටමට සවන් දෙන්නෙක් විය යුතුයි. උදාහරණ ලෙස යාචකයින්, වංචාකරුවන්, මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් වැනි අය එතනට යොමු වී ඇත්තේ ඇයි දැයි සොයා බැලිය යුතුය. කළාව එවැන්නන් බිහිවීම වළකන මාධ්‍යයක් කිරීමට නම් කළා කරුවන් එම තත්වයන් තේරුම්ගත යුතුය. එමෙන්ම තරුණ කලාකරුවන්ට රටේ නීති පද්ධතිය පිළිබඳව අවබෝධයක් තිබීම වැදගත්ය. වැදගත්ම දෙය තම ක්ෂේත්‍රය තුල දක්ෂතාවය මුවහත් කර ගැනීමටද එහි ගෝලීය තත්වය හැදෑරීමටද උත්සහ කල යුතුය.

## ඔන්ලයින් ජරමරේ

Zoom ලෙක්චර්ස් දැන් නම් ඇති වෙලා
පැය දෙකක් ඉන්නවා අප හිත හදා
ඒකෙනුත් බාගයක් මන් නම් නිදියලා
නැගිටින විටදි ලෙක්චර්ස් අවසන් වෙලා.

ඔහේ කියවන් යනව ලෙක්චත්
අවසානෙ තේරුනෙදැයි අසා
ඔලුව කහ කහ yes කියනවා
ලෙක්චර් එක අවසන් නිසා

නෝට් හදනවාතව රෙකෝඩින් එක බලා
ඒකටත් ගොඩ වෙලාවක් යයි ඇතිවෙලා
ඒ මදිවටත් තව එසයින්මන්ට් කිය කියා
දෙනවනෙ වැඩ මහා ගොඩක් දින දින පතා.

දවස තිස්සෙම පෝන් එක අප බල බලා
ඔලුව රිදෙනව රෑට මට අනෙ ඒ නිසා
පිස්සො වේදැයි සිතුන අප දවසක් එදා
අනේ දෙවියනි බලනු මැන දැන්වත් අප දිහා.

- විනිල්කා විජේනාරායන

## විභාගය

මා මෙන් ම මාගේ මිතුරන් ද, අද නිදන්නේ
සුවයක් නැතිව ය.
මා මෙන් ම මාගේ හතුරන් ද, අසහනෙන් ය.
සියළු 12 වසර සත්වයෝ අද පණ බයෙන්.

අහවලුන් කෝල් කරති, සුභ පැතුම් පතා. මගේ
ඔළුව කරකැවේ පේපර් බලා!
බෙල්ල දිගට මකුළු ගමනින් නිදිමත නගිද්දී
මොළෙ භාගය ඇහැරවයි වද දී!

යුද්ධයක ජවයෙන්, ලොකුවම්මා කලබලෙන්,
ඇගෙ දුව ගෙ 'ඒ' 10 යලි මතක් කර දෙයි.
ඒ කාලෙ ජීවිතේ, වර්ජනය කරන තෙක්,
නාඳුනන බාප්පෙකු ට මම ඔළුව සොලවමි.

මම කවු ද? මට මොක ද? අංකයක් විතරද මා?
සම්ප්‍රදාය මා නිසා වෙනස් නොවන වගයි,
"රූලෙන් අහකට යන එකා තනි වෙනවා,"
චීනයේ කොන්ෆූශෙස් වදාල වගයි.

ඉඳුල් කට ගෑමෙ දී පින්සලක් රහ බැලුවලු,
කථාවක අසා ඇත මා ගැන ම, වෙන කල ක.
භෞතික, රසායනික, ගණිත, විද්‍යාවන්
පින්සලට වඩා නම් තිත්ත වනු ඇත

- සකලබුජන්



මල් කුමරි...

දිවි මරණ දරුණු විශ පොළව තුළ සඟවලා
ඉහළ ඇදි ළතාවක අතු අගේ පීදිලා
යනෙන නෙත් හැමක වගෙ සොඳුරු පැහැ තවරලා
දැනෙන සේ හිනැහුනා මල් කුමරි නියඟලා

-ඉන්ද්‍රජිත් කන්කානම්ගේ





හීනියට වැටෙන
පොද වැස්සක
තෙමී තෙමී
ඒ වීදි දිගේ

එන්න ආසයි
එකම දවසක්
දෙන්න හැකි වෙද
මට ජීවිතේ

කප්පරක් අපි
පෙරුම් පිරුවට
සිහිනයකි දැන්
ඒ සුවේ

එකම දවසක්
නුවර එන්නද
කියන්නට මගෙ
ආදරේ

-මලිති නානායක්කාර



**<u>ජීවිතේ</u>**

කාලයකදී පිරිල ඉතිරිලා ලස්සනට වර නගන තිසා වැව

තවත් කාළයකදී හිඳිල වියළිලා යනවා,

රන්වන් පාටට දළුලන ශ්‍රී මහා බෝ හාමුදුරුවන්ගේ බෝ පත්

කාළයත් එක්ක මෝරලා, වියළිලා, ගිලිහිලා යනවා,

සීගිරි ගලේ ගල් පතුරු කී දාහක් නම් මේ වෙනකොට

ගැලවිලා විසිරිලා ගිහින් ඇද්ද? ඒත්,

තිසා වැව තවමත් හිඳි හිඳී පිරෙනවා,

ශ්‍රී මහා බෝ හාමුදුරුවෝ තවමත් රන්වන් පාටින් දළු දාමින්

උඩ මළුවෙ වැඩ ඉන්නවා,

සීගිරිය තවමත් පුරුදු තේජසින් වැජඹෙනවා....

අන්න ඒ වගේ අපෙන් ඈත් වෙලා යන්න හදන

මිනිස්සුන්ට යන්න දෙන්න,

අපිව වටින මිනිස්සුත් එක්ක එකට ඉන්න,

හැමදාමත් පුරුදු ලෙංගතුකමින්...

ජීවිතේ කියන්නෙ මොකක් වුවත්,

ජීවත් වෙනව කියන්නෙ අන්න ඒකටනේ...

- V.D.හර්ෂණී

**<u>මටත් තිබුණේ හදවතක්.</u>**

ඉරා විසි කල
කැලි විසිරුණ
සිතුම් සිතුවිලි හිස් ව ඇති මුත්
මටත් තිබුණේ හදවතක්

අකීකරු වී
සිහින සිතුවම්
මැකී වියැකී
කළු සුදුව ඇත...
ඊට මත්තෙන් සිහි කරනු මැන ;
මටත් තිබුණේ හදවතක්...

මගේ සිතුවිලි
මගේ ආශා
වලට නෑ මෙහි කිසිදු ඉඩකඩ
ඉතින් ගලවා ඉරා දැමුවෙමි
මටත් තිබුණේ හදවතක්...

ඇයි මෙසේ යැයි නොවිමසන් කිසි අයෙක්
මා දවා අළු කල ද සිනාසුණි හැමවරෙක
තවත් බෑ හරි තෙහෙට්ටුයි මට
මටත් තිබුණේ හදවතක්..

- යශෝධරා හේරත්

